සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/09/CBO/සමෘ/කොඩි 2019 | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2019.05.17 |

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය - 2019 මැයි 31 ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**"මතින් දුමෙන් නිදහස් රට - ගෙනෙයි අපේ සිතට සවිය"**

2019 වර්ෂයේ දී ද ඉහත තේමාව මුල් කර ගනිමින් උක්ත වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන හරහා ක්‍රියාත්මක කිරීමට සියළු කටයුතු සූදානම් කර ඇත. පසුගිය වසරේ මෙම වැඩසටහන දීප ව්‍යාප්තව සිදුකල අතර ඒ තුලින් රු. මිලියන 191.3 ක මුදලක් රැස්කර ගෙන ඇත. ඒ සම්බන්ධයෙන් දායකත්වය සැපයූ ඔබ ඇතුළු සියළු නිලධාරීන්ට, ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන නියෝජිතයින්ට ප්‍රතිලාභී ප්‍රජාවට කෘතඥතාවය පිරිනමමි.

2019 වර්ෂයේ ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී 2017 වර්ෂයේ නිකුත් කරන ලද සමෘද්ධි චක්‍රලේඛ ප්‍රජාමූල/03/2017/03 හා2017/05/25 හි සඳහන් උපදෙස් පිළිපැදිය යුතු වේ.

මෙවර මුද්‍රණය කරනු ලබන කොඩියෙහි විශේෂත්වය වන්නේ පහත සඳහන් දිස්ත්‍රික්කවල දරුවන්ගෙන් ලබාගත් කලා නිර්මාණය හා තේමා පාඨය ඒ සඳහා යොදාගෙන තිබීමයි.

මහනුවර, මාතලේ, ගම්පහ දිස්ත්‍රික්කවලින් ලැබී ඇති කලා නිර්මාණ ඇතුළත්ව සකස් කළ නිර්මාණයක් හා නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ලබාදී ඇති තේමා පාඨය ඇතුලත්ව මෙවර කොඩිය නිර්මාණය කර ඇත.

ක්‍රියාත්මක වන ආකාරය :-

01. ඔබගේ ඉල්ලීම පරිදිමුද්‍රණය කර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් පාර්සල් කරන ලද කොඩි,ස්ටිකර්,කැටලේබල් හා පෝස්ටර් 2019/05/22 සිට 24 වන දින දක්වා දිස්ත්‍රික් කාර්යාලවලට විධිමත් ලෙස භාරදෙනු ඇත.

02. 2019/05/27දිනට ප්‍රථම ඉහත අයිතමයන් සමෘද්ධි ප්‍රාදේශිය (මූලස්ථාන) කළමනාකරු වෙත භාරදිය යුතු වේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

03. සියළුමසමෘද්ධි ප්‍රදේශීය (මූලස්ථාන) කළමනාකරුවන්/සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් විසින් ඉහත අයිතමයන් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල ඉල්ලීම් සැලකිල්ලට ගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු හා කලාප සහකාර හරහා සියළුම වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත 2019/05/29 දිනට ප්‍රථම විධිමත් පරිදි භාර දිය යුතු වේ.

04. සියළුම වසම් භාර සංවර්ධන නිලධාරීන් විසින් සපයා ඇති කැටලේබලය අලවා සීල් තබන ලද ආරක්ෂිත කැටයක් සකස් කරගෙන තම වසමට අයත් ප්‍රජාමූල සංවිධානවල සභාපති,ලේකම්,භාණ්ඩාගාරික ඇතුලු විධායක සභාව මෙන්ම සාමාජිකයින් සමඟ එක්ව සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවිඩය ජනතාව වෙත ලබා දෙමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් අරමුදල් රැස්කිරීමට කටයුතු කළ යුතුයි.

05. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමේ දී කිසිම හේතුවක් මත සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් හා ප්‍රජාවගෙන් බලහත්කාරයෙන් මුදල් එකතු කිරීමක් සිදු නොකල යුතු අතර එසේ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ.

06. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම මගින් අරමුදල් රැස් කිරීම 2019 මැයි 31 දින පෙ.ව.8.00 සිට ජුනි 30 ප.ව.4.00 දක්වා පමණක් සිදු කළ යුතු අතර ජුලි 01 වන දින එම අරමුදල් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයට අයත් ඉතිරි කිරීමේ ගිණුමට තැන්පත් කල යුතුය.

07. සියළුම සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ඉතිරි කිරීම් ගිණුමට තැන්පත් කරන ලද කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස් කරන ලද මුදල් පමණක් එක් එක් ප්‍රජාමූල සංවිධානයේ සභාපති හා භාණ්ඩාගාරිකගේ ලිඛිත ඉල්ලීමකට අනුව ප්‍රාදේශීය සංවිධානය නමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ ආරම්භ කර ඇති සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමට බැර පිණිස ලියන ලද චෙක්පතක් මගින් 2019 ජුලි 05 දිනට ප්‍රථම යැවිය යුතුයි

08. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් ඒකරාශී කරන ලද අරමුදල් පිළිබඳ වාර්තා සකස් කිරීම චක්‍රලේඛයට අනුකූලව සිදුකළ යුතුය.

09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් වාර්තාව සකස් කර සමෘද්ධි අධ්‍යක්ෂකගේ ආවරණ ලිපියක් සමඟින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අංශය වෙත 2019 ජුලි 18 ට ප්‍රථම එවිය යුතුය.

<u>අරමුදල් වියදම් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

( සමෘද්ධි චක්‍රලේඛ 05/2017/05 චක්‍රලේඛයේ උපදෙස් හා ඇමුණුම පරිදි සිදුකළ යුතුය).

01. 2019 ජුලි 31 දිනට පෙර සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ඇතුළුව සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සාමාජිකයන්ගේ ව්‍යාපෘති යෝජනා ලබාගත යුතු වේ.
02. 2019 අගෝස්තු 31 දිනට පෙර සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ප්‍රමුඛතා ලේඛන සකස් කළයුතු වේ..
03. 2019 සැප්තැම්බර් 30 ට පෙර අදාල යෝජනා ඇතුලත්ප්‍රමුඛතා ලේඛනය ප්‍රාදේශීය සංවිධානයේ මහ සභාව වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතු වේ.
04. 2019 ඔක්තෝම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා සිදුකරන සියළු වැඩසටහන්වල වියදම් වාර්තා 2020/01/15 ට පෙර ප්‍රධාන කාර්යාලයේ ප්‍රජාමූල සංවිධාන අංශයට ලබා දිය යුතුය.
05. 2020 ජනවාරි සිට මැයි 31 දක්වා සිදු කරන සියළු වැඩසටහන්වල වියදම් වාර්තා 2020/06/15 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ ප්‍රජාමූල සංවිධාන අංශයට එවිය යුතුය.
06. පෙර වර්ෂ වලදී ලබාදුන් ආකෘති පත්‍රවලට අමතරව මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව ද වියදම් වාර්තාවක් සෑම මසකම එවීමට කටයුතු කළ යුතු වේ.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම හා සෑම බැංකුවක් ආසන්නයේම පෝස්ටරයේ සඳහන් වගන්ති ඇතුලත්ව නිර්මාණශීලීව සකස්කර ගත් බැනරයක් ප්‍රදර්ශණය කිරීම වඩාත් සුදුසු වේ.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර,

අධ්‍යක්ෂ ජනරාල්.

<u>ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන **-2019**</u>

දිස්ත්‍රික්කය :- -----------------------------

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අරමුදල් වියදම් කිරීම | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2017 කොඩි | | 2018 කොඩි | | 2019 කොඩි | |
| | | ආදායමින් 90% | වියදම | ආදායමින් 90% | වියදම | ආදායමින් 90% | වියදම |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

- ✶ සෑම මසකට වරක් මෙම වාර්තාව එළඹෙන මස 05 දිනට පෙර ලබාදිය යුතුයි.

| සකස් කළේ | අනුමත කළේ |
|---|---|
| දිස්ත්‍රික් විෂයභාර කළමණාකරු | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ |
| නම :-………………………………………. | නම :-………………………………………. |
| අත්සන :-……………………………….. | අත්සන :-……………………………… |